# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2374/43  2024  මාර්තු මස 09 වැනි සෙනසුරාදා 2024.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 121, වක්වැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වක්වැල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BPP/2023/61 හා 2023.03.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර **"A"** - කරිජ්ජැල්ලවත්ත අද්දර කුඹුර - **ප්‍රමාණය: හෙක්. 0.0466 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: කරිජ්ජැල්ලවත්ත අද්දර කුඹුර මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට : කරිජ්ජැල්ලවත්ත අද්දර කුඹුර මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/13/2022/PC/244.
2024 පෙබරවාරි මස 01,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 - 0068